# ඉතිහාසය විකෘතිකිරීම

මේ ලිපියට නිමිත්ත වනුයේ පසුගිය සතියේ ලිපියේ අවසාන ඡේදය ය. මෙරට ක්‍රිස්තියානිය අනුරාධපුර කාලයට දිවයන්නක් බවට කීමට ඇතැම් පූජකවරු උත්සාහකරති. ඒ පූජකවරුන්ගේ පමණක් නොව සිංහලයන්ගේ පැරණි ඉතිහාසය වෙනස්කර මෙරට දෙමළ ඉතිහාසයක් ගොඩනැගීමට වෙර දරන්නවුන්ගේ ද අභිප්‍රාය කුමක් දැයි පැහැදිලි ය. මෙකල ඉතිහාසය නැවත ලිවීම තරම් ලාභ ප්‍රයෝජන ඇති තවත් කාර්යයක් නැත. ඕනෑම ඉතිහාසයක් ලියැවෙන්නේ වර්තමානයෙහි ය. රටක, ජාතියක, ගෝත්‍රයක පමණක් නොව යමකුගේ පෞද්ගලික ඉතිහාසය වුව ද වර්තමානයෙහි ලියැවෙයි. ස්වයං හෙවත් ආත්ම චරිතාපදාන ද ඈතුළුව චරිතාපදාන ද ලියැවෙන්නේ වර්තමානයෙහි ය. අතීත කතාවක් ලෙස වර්තමානයෙහි ලියැවෙනු හැරෙන්නට ඉතිහාසය ලියන වෙනත් ක්‍රමයක් නැත. එහෙත් එයින් කියැවෙන්නේ වර්තමානයෙහි, එනම් එක් කාල පරිච්ඡේදයක ලියැවෙන ඉතිහාස එකම රීතියකට, මෝස්තරයකට අනුව ලියැවෙන බව නො වෙයි. එකම කාල පරිච්ඡෙදයක වුව ද ඉතිහාසය ලියැවෙන්නේ ඒ ඒ ලේඛකයාට හෝ ඒ ඒ ලේඛකයා පිටුපස සිටින්නන්ට හෝ අදාළ අන්දමට ය.

ඉතිහාසයෙහි අහවල් කාලයෙහි අහවල් ක්‍රියාව සිදුවිණි යැයි අපි කියමු. ඒ බව අද අප දන්නේ කෙසේ ද? කොළඹ විශ්ව විද්‍යාලයෙහි ඉතිහාසය උගන්වන එක් පශ්චාත්නූතනවාදී විහිළුකාරයකු ඉතිහාසයෙහි අහවල් දේ සිදුවුණු බව දන්නේ කෙසේ දැයි තම සිසුන්ගෙන් අසා ඇත. එය ඒ විහිළුකාරයට ද දිරවාගත හැකි ප්‍රශ්නයක් නොවන බව පැහැදිලි ය. එවැනි ප්‍රශ්නයක පිටුපස ඇත්තේ දැනුම යනු කුමක් ද යන දාර්ශනික ප්‍රශ්නය ය. ඉතිහාසය ද දැනුමක් මිස වෙනත් දෙයක් නො වෙයි. ඉතිහාසයෙහි අහවල් දේ සිදුවිණි ද නැත් ද යන්න අවසාන විග්‍රහයෙහි දී අනෙක් දැනුම් මගින් තීරණය වෙයි. ඒ විහිළුකාරයාගේ පියා කවුද යන ප්‍රශ්නයට දෙන පිළිතුර කුමක් ද? යමකු තමාගේ පියා අසවලා යැයි ප්‍රකාශකරන්නේ කෙසේ ද? යමකු තම පියා පිළිබඳ දැනුම ලබාගන්නේ කෙසේ ද? එය උප්පැන්න සහතිකයේ පියාගේ නම යැයි සඳහන්වන කොටුවේ ඇති දත්තයෙන් ප්‍රකාශවන දැනුම ද?

අපට සියළු දැනුම් ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත හැකි නො වෙයි. ප්‍රත්‍යක්ෂයෙන් ලබාගන්නා දැනුම් වුව ද නිවැරදි යැයි යමකු කියන්නේ කෙසේ ද? නිවැරදි යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද?  ඇතකුගේ පියසටහන් පමණක් දැකීමෙන් ඇතකු ගමන්කර ඇති බව නිගමනය කළ නොහැකි බව කාටත් වඩා හොඳින් සිංහල බෞද්ධයෝ දනිති. එහෙත් ඇතා ප්‍රත්‍යක්ෂයෙන් දුටු පමණින් වුව ද ඒ ඇතකු යැයි කිව හැකි ද? එතැන ඇත්තේ ඇතකු නොව පංචස්කන්ධයක් පමණක් යැයි කීවොත් එය නිවැරදි ද? පංචස්කන්ධය යැයි ගතහැකි ආත්මීය යමක් එතැන වේ ද? පුටුවක් පුටුවක් ලෙස ගැනීම නිවැරදි ද? පුටුවක් පුටුවක් ලෙස ගත්විට එහි ආත්මවාදයක් ඇති බව බෞද්ධයෝ දනිති. දැනුම පිළිබඳ කතාවෙහි දී සිංහල බෞද්ධයන් සමග හැප්පීමට හැකි ජගතුන් මේ දියතෙහි නැත. සිංහල බෞද්ධයන්ගේ සංස්කෘතියෙහි පදනමෙහි ම දැනුම යනු කුමක් ද යන්න තිර ලෙස ම සටහන්කිරීමට මිහිඳු මහරහතන් වහන්සේ සමත් වී ඇත. ඉතිහාසයෙහි සටහන් ඒ පුවත අද දන්නේ කෙසේ දැයි දැන් යමකුට ප්‍රශ්න කළ හැකි ය. ඒ තැනැත්තා කවුරුන් වුව ද අප ඔහුගෙන් අසන්නේ ඔබේ පියා අහවලා බව ඔබ දන්නේ කෙසේ ද යන්න ය. එය ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි දෙයක් නොවන බව ඔහු මෙන් ම අපිදු දනිමු. අපි ඒ බව, එනම් තමාගේ පියා කවු ද යන්න ප්‍රත්‍යක්ෂයෙන් දැනගැනීමට නොහැකි බව, දන්නෙමු ද? සියළු දැනුම් සාපේක්ෂ වෙයි. දැනුම සාපේක්ෂ යන්න ද සාපේක්ෂ දැනුමක් වෙයි. යථාර්ථයක් යනුවෙන් දෙයක් ලෝකයේ ඇතැයි සිතන්නෝ ආත්මවාදීහු වෙති. බුදුන්වහන්සේ ද ඊනියා යථාර්ථයක් සොයාගිය බව කිවහැක්කේ බටහිර ක්‍රිස්තියානි දැනුමට සාපේක්ෂව ය. එසේ කියන්නෝ ඒ ක්‍රිස්තියානි දැනුමෙන් හිස කුරුවල්කරගත්තෝ වෙති. බුදුන් වහන්සේගේ යථාර්ථය මාක්ස්ගේ යථාර්ථය සමග සන්සන්දනයකිරීම තරම් තවත් තකතීරු වැඩක් තිබිය නො හැකි ය. එය හාවාගේ අං හරකාගේ අං සමග සන්සන්දනයකිරීම වැනි වූවකි. අං නැති හාවාගේ අං වෙනත් සතුන්ගේ අං සමග සන්සන්දනය කළහැක්කේ අං ඇත්තකුට පමණ ය. සාපේක්ෂතාව හා ඊනියා යථාර්ථය ගැන එතැනින් ඔබ්බට ගිය දැනුමක්, ඔව් සාපේක්ෂ දැනුමක්, ලබාගැනීමට කැමැත්තෝ මගේ ලෝකය කියවත්වා. එහෙත් ඒ කියවූ පමණින් තේරෙන බවක් මෙයින් ගම්‍ය නො වෙයි. බොහෝ කසිකබල් උගතුන්ට ඒ නොතේරෙන බව අවුරුදු විස්සකට ආසන්න කාලයක් තිස්සේ මම අත්දැකීමෙන් දනිමි. එහෙත් අට පාස්යැයි කියන ඇතැමුන්ට ද ඒ අවබෝධ වී ඇත්තේ මෙරට බටහිර ගැති අධ්‍යාපනයේ මහිමය මේ යැයි කියන්නාක් මෙන් ය.

© Prof. Nalin De Silva

අපි නැවතත් ඉතිහාසයට යමු. අද මෙරට සහ පිටරට ඊනියා ඉතිහාසඥයන්ට පමණක් නොව වෙනත් බොහෝ දෙනාට ද අවශ්‍ය කටයුත්තක් වී ඇත්තේ සිංහලයාට හිමි සිංහලය සිංහලයන්ට අහිමි කිරීම ය. මෙවැනි ප්‍රකාශයක් කළ වහාම එය ජාතිවාදී යැයි  කියන්නෝ වෙති. මෙරට සිංහල නොවන්නන්ට අයිති නැත්දැයි ඔවුහු ප්‍රශ්නකරති. මෙරට එහි පුරවැසියන් කාහටත් අයිතිය. එහෙත් ඒ සියල්ලට පළමු සිංහලයන්ට අයිති ය. සිංහලයන්ට කිසිම අයිතියක් නොදී අනෙක් සියල්ලන්ට රට අයිතිකර දීමේ ව්‍යාපෘතියක් අද ක්‍රියාත්මක වනබව රහසක් නො වෙයි. සිංහලයන්ට සිංහල බෞද්ධ සංස්කෘතියවත් හිමි නැතැයි කීමට අද ව්‍යාපාරයක් පටන් ගැනී ඇත. මෙරට ඉතිහාසය ගොඩනැගුවේ අනුරාධපුර සමයෙහි ජීවත් වූ ක්‍රිස්තියානින් හා දෙමළ බෞද්ධයන් යැයි කසිකබල් උගතුන් කීවොත් ඒ ගැන පුදුම නො විය යුතු ය. ඒ සඳහා සෙනරත් පරණවිතාන මහතා සෙල්ලිපිවල පේලි අතර කියවී යැයි කියන දෑ සහ වෙනත් උගතුන්ගේ ලේඛන සාක්ෂියට කැඳවීමට ද ඉඩ ඇත. පරණවිතාන මහතා මෙරට පුරාවිද්‍යාවට කෙතරම් සේවයක් කළ ද ඔහුගේ ක්‍රිස්තියානි පසුබිම අමතක නොකළ හැකි ය.  ඔහු කියා ඇති දේ සැලකීමේ දී මේ පසුබිම අමතක නොකළ යුතු ය. ඔහුගේ ඊනියා පේලි අතර සටහන් කියවීමේ දී අප ද කියවිය යුත්තේ පේලි අතර ය. අවසාන විග්‍රහයෙහි දී යමකු නිර්මානය කරන දැනුම ඔහුගේ ඉන්ද්‍රිය පද්ධතියට සංස්කෘතියට හා මනසට ද සාපේක්ෂ ය. පිරිමින් නිර්මානයකරන දැනුමට වඩා වෙනස් දැනුමක් ස්ත්‍රීන් විසින් නිර්මානයකෙරීමට ඉඩ තිබෙන නමුත් අද බොහෝ ස්ත්‍රීන් ගේ ද පිරිමින්ගේ මෙන් ම මනස් බටහිර අධ්‍යාපනය විසින් බටහිර ක්‍රිස්තියානි කෙරී ඇති බැවින් ඔවුන් අතින් ද නිර්මානය වන්නේ පිරිමින්ගේ බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයට අවශ්‍ය දැනුමක් ය.

ඉතිහාසය විකෘතිකිරීම ගැන අපි දැනට උදාහරණයක් මගින් සලකා බලමු. අද බොහෝ දෙනා කියන අන්දමට මෙරට ආදිවාසීහු වැද්දෝ වෙති. වැද්දන් ආදිවාසීන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට කැන්දන්යෑමට තරම් මානවා හිතවාදීහු බටහිර වෙති. ඒ බටහිරයෝ වැද්දන් රැගෙන එවැනි සම්මන්ත්‍රණවලට ගොස් මේ ලංකාවේ ආදිවාසීන් යැයි හඳුන්වාදෙති. මෙය ඉතා අහිංසක ව්‍යාපාරයක් ලෙස නැත්නම් හුදු අධ්‍යයනික කටයුත්තක් ලෙස බොහෝ දෙනාට පෙනී යනු ඇත. එහෙත් ඒ පසුපස ඇත්තේ ඉතිහාසය විකෘතිකිරීමක් ය. මේ ශාස්ත්‍රීය මහත්වරුන්ට හා මහත්මීන්ට වැද්දන් මෙරට ආදිවාසීන් යැයි කීමට ඇති සාධක කවරේ ද? මේ කිසිම අයකු ලංකාවේ ආදිවාසීන් කවුරුන්දැයි දැනගැනීම සඳහා ඊනියා පර්යේෂණයක් කර තිබේ ද? ඔවුන්ට ඇත්තේ වැද්දන්ගේ ජීවන රටාව පිළිබඳ නිරීක්ෂණ කිහිපයක් පමණකි. සිංහලයන්ට පින්සිදුවන්නට සිංහලයන් අතර ජීවත්වෙමින් අවුරුදු දහස් ගණනක් තිස්සේ තම අනන්‍යතාව රැකගැනීමට වැද්දන් සමත්වුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මෙරට ආක්‍රමණයකිරීමෙන් පසුව ඔවුන්ට තවදුරටත් තම අනන්‍යතාව රැකගැනීමට නොහැකි බව පෙන්නුම්කර ඇත.

කිසිම අධ්‍යයනයකින් තොරව වැද්දන් මෙරට ආදිවාසීන් යැයි තීරණය කෙරෙන්නේ කරුණු දෙකක් මත පමණක් පදනම් වී ය.  වැද්දන් තම ජීවන රටාව බොහෝ කලක් රැකගෙන තිබීම හා එවැනි ජීවන රටා ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන් යැයි හැඳින්වෙන්නන්ට තිබීම පළමු කරුණ ය. දෙවැන්න වන්නේ සිංහලයන් මෙරටට ඉන්දියාවෙන් පැමිණි බවට සාමාන්‍යයෙන් ඇති මතය ය. වැද්දන් මෙරටට පැමිණියේ කොහෙන්දැයි සඳහන් නොවන බැවින් ඔවුහු ආදිවාසීහු වෙති! මේ මුළුමනින්ම බටහිරයන් ඕස්ට්‍රේලියාවේ හා ඇමරිකාවේ ලත් අත්දැකීම් මත පදනම් වූවක් මිස ඊනියා යථාර්ථයක් නො වෙයි. යුරෝපීයයන් ඉහත කී මහාද්වීපවලට යනවිට එහි ජනයා විසූහ. ඒ ජනයා ඒ රටවල ආදිවාසීහු වෙති. එලෙසට සිංහලයන් මෙරටට පැමිණෙනවිට මෙහි විසීයැයි කියන ජනයා ලංකාවේ ආදිවාසීහු වෙති. බටහිර ක්‍රිස්තියානි උගතුන්ගේ තර්කය එතරම් ම සරල ය. එමගින් ඔවුහු සිංහලයන් ද මෙරටට පැමිණ පදිංචි වූ සංක්‍රමණිකයන් ගොඩට දමති. එවිට සිංහල, මුස්ලිම්, දෙමළ සියල්ලෝ මෙරට සංක්‍රමණිකයෝ වෙති. වැද්දෝ පමණක් ආදිවාසීහු වෙති. වැද්දන් මෙරට පාලන බලයක් නොඉල්ලන බැවින් මෙහි ගැටළුවක් නැත. එමෙන් ම එමගින් සිංහලයන්ට හා සිංහලත්වයට මෙරට හිමි වැදගත්කම නැතිවන බැවින් එය දෙමළ ජාතිවාදයට හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සේවයක් ද කරයි. අහිංසක යැයි පෙනෙන ව්‍යාපෘති එබඳු ය.  වැද්දන්ට එවැනි ආදිවාසී තත්ත්වයක් ප්‍රදානයකිරීමෙන් පසුව කල්යෑමේ දී දෙමළ ජනයා මෙරටට සංක්‍රමණය වූයේ සිංහලයන්ට පෙර යැයි ද ප්‍රවාදයක්, එනම් මතවාදයක් (සියළු ප්‍රවාද යනු මතවාද හෙවත් කතන්දර වෙයි) ද නිර්මානය කරගත හැකි ය. සිංහල ජාතිය මෙරටට කොහෙන්වත් පැමිණි ජාතියක් නොව මෙරටම නිර්මානය වූ ජාතියක්  බව පෙන්වාදීම අසීරු කරුණක් නො වෙයි.

© Prof. Nalin De Silva